ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය - 2023

---------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ ("කාර්යාංශය") 2023 දෙ සැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කාර්යාංශය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කාර්යාංශය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කාර්යාංශයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කාර්යාංශයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කාර්යාංශයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කාර්යාංශයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කාර්යාංශයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව

සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කාර්යාංශයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කාර්යාංශය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 දෙසැම්බර් 31 දිනට විදේශ ව්‍යවහාර මුදල් ගිණුමේ ශේෂය රු.110,434,523 ක් විය. කෙසේ වෙතත්, පූර්ව වර්ෂයේ ප්‍රතිපත්තියට අනුව මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කරන ලද විනිමය අනුපාතිකය සලකා බැලීමේදී එය රු.108,817,399 ක් විය යුතු අතර, මේ අනුව රු.1,617,124 ක වෙනසක් නිරීක්ෂණය විය. තවද, අදාළ විනිමය අනුපාතිකය පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපත්තියක් අනාවරණය කර නොතිබුණි. | විදේශීය ඉන්වොයිසි සඳහා ගෙවීම් කිරීමේදී බැංකුව විකුණුම් අනුපාතය භාවිතා කරන අතර දේශීය මුදල් බවට පරිවර්තනය කිරීම ගැනුම් අනුපාතය මත පදනම් වේ. ඒ අනුව, විදේශ මුදල් ව්‍යවහාර ගිණුමේ පවතින ශේෂය 2023 දෙසැම්බර් 29 වැනි දින විදේශ විනිමය හුවමාරු අනුපාතය (Spot Rate) අනුව තක්සේරු කර ඇත. | විනිමය අනුපාතිකයට අදාළ ප්‍රතිපත්තිය හෙළිදරව් කර එය යොදා ගැනීමට ක්‍රියා කළ යුතුය. |
| (ආ) | විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් විස්තර නොමැතිව සමස්ථයක් ලෙස පියවීම් ඉදිරිපත් කිරීම හේතුවෙන් ඉන්දියාවට ගෙවිය යුතු මුදලක් ලෙස සඳහන් රු.6,866,554 ක මුදලක් විදේශ අත්තිකාරම් ගිණුමෙන් අඩු කර තිබුණි. වත්කම් ගිණුම් හා වගකීම් ගිණුම් එකිනෙකට හිලව් නොකළ යුතු බැවින්, ගෙවිය යුතු ඉන්දියානු ගිණුම් ශේෂය සහ විදේශ අත්තිකාරම් ගිණුම් ශේෂය එකී මුදලින් අඩුවෙන් දක්වා තිබුණි. | විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් මුදල් ප්‍රේෂණය කිරීම සම්බන්ධයෙන් තොරතුරු අප වෙත දන්වා නොතිබුණු බැවින් විදේශ අමාත්‍යාංශයෙන් ලැබිය යුතු මුළු අත්තිකාරම් මුදලින් එම මුදල් අඩුකර ඇත. | විවිධ ගිණුම්වල ශේෂයන් එකිනෙක හිලව් නොකළ යුතුය. |
| (ඇ) | විගණනයේ ගණනය කිරීමට අනුව වර්ෂය සඳහා නිවැරදි ස්ථාවර තැන්පතු පොලිය රු.1,283,462,464 ක් වුවද, එය රු.1,274,245,046 ක් ලෙස හඳුනාගෙන තිබුණෙන් රු.9,217,418 ක වෙනසක් නිරීක්ෂණය විය. තවද, 2023 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු පොලිය රු.340,742,327 ක් බව විගණනය | කාලසීමාව සඳහා පොලිය ප්‍රතිපාදන ගණනය කිරීමේදී අප ගණනය කළේ දින 364 භාවිතා කරමිනි. කෙසේ වෙතත්, පසුව ලංකා බැංකුව විසින් දින 365 සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව දින 364 භාවිතා කරමින් ගණනය කර ඇති බව සටහන් විය. එබැවින්, ස්ථාවර තැන්පතු කල්පිරෙන අවස්ථාවේදී සැබෑ | ගිණුම්වල පොළී ආදායම නිවැරදිව හඳුනාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ගණනය කර තිබුණද එය ගිණුම්වල රු.4,773,463 ක අඩුකිරීමක් සහිතව රු.335,968,864 ක් ලෙස හඳුනාගෙන තිබුණි. | ප්‍රේෂණ ලැබුණු විට ගිණුම්වල සැබෑ පොළී ආදායම සකස් කරනු ලැබේ. තවද, පෙන්වා දී ඇති වෙනස 2023 වර්ෂය සඳහා උපචිත මුළු ආදායමෙන් සියයට එකකට වඩා අඩු අගයකි. | |
| (ඇ) | වර්ෂය තුළ භාණ්ඩාගාරයට ප්‍රේෂණය කරන ලද රු.500,000,000 ක මුදල හිමිකම් වෙනස්වීම් ප්‍රකාශයේ හඳුනා ගැනීම වෙනුවට මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ වියදමක් ලෙස හඳුනාගෙන තිබුණු අතර එය මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ වෙනම ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි.. | 2023 මූල්‍ය වර්ෂය සඳහා බදු අය කිරීමේ ක්‍රමයක් ලෙස භාණ්ඩාගාරය විසින් දායකත්වය ඉල්ලා ඇති බැවින්, කාර්යාංශය විසින් මෙම බද්ද 2023 වර්ෂය සඳහා වූ අතිරික්තයෙන් ගෙවීමක් ලෙස පසුගිය වසරවලට අනුකූල වන පරිදි මූල්‍ය කාර්ය සාධනය යටතේ රු.500,000,000 ක දායකත්වයක් ලෙස සටහන් කර ඇත. | හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශයේ භාණ්ඩාගාර දායකත්වය හඳුනාගත යුතු අතර එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ද වෙනම ඉදිරිපත් කළ යුතුය. |
| (ඉ) | කාර්යාංශය විසින් විදේශ දූත මණ්ඩල දෙකකට ලබා දුන් අත්තිකාරම්වලින් ඉතිරි රු.1,608,302 ක මුදල දූත මණ්ඩල විසින් 2018 - 2020 කාලය තුළ විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත යවා තිබුණු අතර එය සෘජුවම මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර තිබුණි. කෙසේ වෙතත්, කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව එම ශේෂයන් සමාලෝචිත වර්ෂය අවසානයේ නිරවුල් නොවූ ලැබිය යුතු ශේෂ ලෙස දක්වා තිබුණි. . | ඉල්ලීම් සිදු කර තිබුණද විදේශ කටයුතු අමාත්‍යාංශය මුදල් ප්‍රේෂණය කර නොතිබුණි. අදාළ මුදල් මහා භාණ්ඩාගාරයට ප්‍රේෂණය කර ඇති බැවින් කපා හැරීමේ හැකියාවක් තිබේද යන්න පිළිබඳව විගණන හා කළමනාකරණ කමිටුවේ උපදෙස් ලබා ගැනීමට නියමිතය. | මහා භාණ්ඩාගාරයෙන් උපදෙස් ලබාගෙන නිසි ක්‍රියා පටිපාටියක් අනුගමනය කරමින් ගිණුම්වලින් ලැබිය යුතු මුදල් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2016 සිට 2019 දක්වා කාලය සඳහා විදේශ දූත මණ්ඩලවලින් අයවිය යුතු රු.2,320,040 ක ශේෂයක් සමාලෝචිත වර්ෂය අවසානයේදී පවා පියවා නොතිබූ අතර විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් අයවිය යුතු රු.967,738 ක මුදලක් ද වර්ෂ 3 සිට 5 දක්වා කාලයක් තිස්සේ හිඟව පැවතුණි. | නිරීක්ෂණ සමඟ එකඟ වන අතර නියමිත මුදල් අයකර ගැනීම සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශය සමඟ අඛණ්ඩව පසු විපරම් කරමින් සිටී. | මෙම මුදල අයකර ගැනීමට කඩිනම් පියවර ගත යුතුය . |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වර්ෂ 07 සිට 13 දක්වා වූ කාලය සඳහා රු.11,521,809 ක් වූ හිඟ ණයහිමි ශේෂයන් සමාලෝචිත වර්ෂය අවසානයේදී ද පියවා නොතිබුණි. | ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය වෙත ගෙවීම් වවුචර ඉදිරිපත් නොකිරීමේ ප්‍රතිඵලයක් ලෙස මෙම තත්ත්වය ඇති වී ඇත. විගණන හා කළමනාකරණ කමිටුව වෙතින් උපදෙස් ලබාගෙන අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කර පසු විපරම් කරනු ඇත. | මේ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු අතර නොවිසඳුණු ණයහිමි ශේෂයන් පියවිය යුතුය. |
| (ආ) | වර්ෂ 5 ක කාලයක් තිස්සේ රු.677,930 ක් වූ හිඟ උපචිත වියදම් සහ වර්ෂයක කාලයක් තිස්සේ රු.6,257,806 ක් වූ හිඟ උපචිත වියදම් සමාලෝචිත වර්ෂය අවසානයේදීද පියවා නොතිබුණි. | රු.677,930 ක් වූ මෙම හිඟ ශේෂය එක්සත් රාජධානියේ විදේශ දූත මණ්ඩලයට අනුයුක්තව සිටි නිලධාරියෙකුට සම්බන්ධ බැවින් ඔහුගේ පසුගිය මාසයේ වැටුප ගෙවීමට කාර්යාංශය වෙත තවමත් අවසර ලැබී නැත. තවද රු.6,257,806 ක මුළු උපචිත වියදම 2024 මැයි 31 දින වන විට රු.1,265,870 ක් දක්වා අඩු කර ඇත. | මෙම ශේෂ නිරවුල් කර වගකීම් ලේඛනයෙන් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.3 අත්තිකාරම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසාන දිනට එකතුව රු.45,707,620 ක් වූ විදේශ දූත මණ්ඩල අත්තිකාරම් පිළිබඳ ශේෂ තහවුරු කිරීම් ලැබී නොතිබුණි. | කාර්යාංශය වෙත විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් 2023 වර්ෂය තුළ සිදු කරන ලද ගෙවීම් සම්බන්ධයෙන් පමණක් තහවුරු කිරීමේ ලිපියක් ලැබී තිබුණි. එම තහවුරු කිරීමේ ලිපියට අනුව රු.3,264,261 ක් පමණක් 2023 වර්ෂය තුළ ප්‍රේෂණ යවා තිබුණි. | විදේශ කටයුතු අමාත්‍යාංශය සමඟ අත්තිකාරම් සැසඳුම් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ VII පරිච්ඡේදයේ 40 ඡේදයේ 09 වැනි උපවගන්තිය | මෙම වගන්තියට අනුව වර්ෂයේ ක්‍රියාකාරකම් පිළිබඳ ඉදිරිපත් කළ යුතු වාර්තා, ප්‍රකාශන සහ සැලසුම් සෑම වසරකම අවසානයේ සිට මාස තුනක් ඉකුත්වීමට පෙර අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. | සටහන් කර ඇත . | පනතට අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | රජය සතු ව්‍යවසායයන් සඳහා වන යහපාලනය පිළිබඳ මාර්ගෝපදේශයේ 2.3 ඡේදය | කාර්යාංශය සඳහා උපායමාර්ගික සැලැස්මක් 2020-2023 දක්වා වූ වර්ෂ හතරක කාලය සඳහා සකස් කර තිබුණු අතර අද දක්වා එය යාවත්කාලීන කර නොතිබුණි. | සටහන් කර ගත් අතර ඉදිරියේ දී පියවර ගනු ඇත. | උපායමාර්ගික සැලැස්ම වර්ෂ පහක කාලයක් සඳහා සකස් කර භාණ්ඩාගාරයට ඉදිරිපත් කළ යුතු අතර සෑම වර්ෂයකම යාවත්කාලීන කළ යුතුය. |
| (ඇ) | 2021 නොවැම්බර් 16 දිනැති රජය සතු ව්‍යවසාය (SOE) සඳහා වන මෙහෙයුම් අත්පොතේ 6.6 ඡේදය | 2022 වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව මේ දක්වා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | වාර්ෂික වාර්තාව ඉදිරි වර්ෂයේ මැයි 31 දින හෝ එදිනට පෙර පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.3,492,042,780 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.2,442,010,989 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,050,031,791 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට අපගමන බදු ආදායම රු.1,318,778,832 කින් වැඩි වීම, සංචාරක සංවර්ධන බද්ද රු.604,418,231 කින් වැඩි වීම සහ ආයෝජන මත පොළිය ආදායම රු.582,237,191 කින් වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු.1,760,268,107 ක් වූ මුළු වියදමින් සියයට 90 ක් අලෙවිකරණ කටයුතු සඳහා වැය කර තිබුණද, සමාලෝචිත වර්ෂය සඳහා කාර්යාංශය විසින් ප්‍රවර්ධනය සඳහා ප්‍රමුඛතා ක්ෂේත්‍ර හඳුනාගැනීම සඳහා අලෙවිකරණ සැලැස්මක් සකස් කර නොතිබුණි. | කාර්යාංශය වෙනම අලෙවිකරණ සැලැස්මක් සකස් නොකරයි. එය විස්තරාත්මක වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර ඇත. | කාර්යාංශය විසින් අලෙවිකරණ සැලැස්මක් වෙනම සකස් කළ යුතුය. |

### 3.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 ජූලි මාසයේදී ශ්‍රී ලංකාවේ පැවති TAAI සමුළුව සඳහා ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය හා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය | දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු තීරණයක් මඟින් අදාළ කොඩි සැලසිනේ සමාගම වෙතින් මිලදී ගත් | නියමිත පරිපාටියෙන් බැහැරවීම් සඳහා |

| | | |
|---|---|---|
| රහිතව සභාපතිවරයාගේ අනුමැතිය යටතේ රු.10,120,000 ක වියදමින් "Visit Sri Lanka" සන්නාමගත කොඩි 500 ක් මුද්‍රණය කර තිබුණි. කෙසේ වෙතත්, මෙහිදී ගුණාත්මකභාවය සහ පිරිවිතරයන් සපුරා නොතිබුණු අතර සතුටුදායක අන්දමින් කාර්යය ඉටු වූ බවට වාර්තාවක් අද දක්වා ඉදිරිපත් කර නොතිබුණි. තවද, ඇස්තමේන්තුවට වඩා පිරිවැය ඉහළ ගොස් ඇති අතර එය කොඩියකට වැට් බද්ද රහිතව රු.17,600 ක් වූ බව නිරීක්ෂණය විය. | බව තහවුරු කරන අතර කොඩිවල ප්‍රමාණයේ වෙනස ගැලපීමෙන් හා මිල සාකච්ඡා කිරීමෙන් පසුව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ගෙවීම් කර ඇත. | පූර්ව අනුමැතිය ලබා ගත යුතු අතර පවතින මාර්ගෝපදේශවලට අනුකූල විය යුතුය. |

## 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 වසරේ ජර්මනියේ සහ චීනයේ පැවති ප්‍රවර්ධන වැඩසටහන් සඳහා සහභාගිවන්නන්ට ගුවන් ටිකට්පත් මිලදී ගැනීමේදී, ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය නියමිත වේලාවට ආරම්භ කර නොතිබීම, ලංසු සඳහා ආරාධනා කිරීම සඳහා ලබා දී ඇති සීමිත කාලසීමාව, නිසි අනුමැතිය රහිතව ඇස්තමේන්තුවට වැඩියෙන් ගෙවීම් කිරීම සහ සාකච්ඡා කර මිල ගණන් තීරණය නොකිරීම ආදිය නිරීක්ෂණය විය. | නිරීක්‍ෂණය සමඟ එකඟ වන නමුත් මෙය ආර්ථික අර්බුදය සහ අනුමැතිය ලබාගැනීමේ ප්‍රමාදය හේතුවෙන් වැඩසටහන් සඳහා තීරණ අවසාන මොහොතේ ගැනීම හේතු විය. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ පිළිපැදීමට පියවර ගත යුතුය . |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) නියෝජ්‍ය කළමනාකාර අධ්‍යක්ෂ (මෙහෙයුම්), අධ්‍යක්ෂ (නව නිර්මාණ සංවර්ධන), අධ්‍යක්ෂ (ප්‍රවර්ධන), සහකාර අධ්‍යක්ෂ තනතුරු දෙකක (අලෙවිකරණ), සහකාර අධ්‍යක්ෂ (SPR), සහකාර අධ්‍යක්ෂ (මුදල්), අභ්‍යන්තර විගණක සහ කනිෂ්ඨ කළමනාකරුවන් 11 ක තනතුරුවල පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි. | අවශ්‍ය සංශෝධිත බඳවා ගැනීමේ ක්‍රියාපරිපාටිය 2022 දී අනුමත කරන ලදී. එබැවින් 2023 දී නියෝජ්‍ය කළමනාකාර අධ්‍යක්ෂ, අධ්‍යක්ෂ, සහකාර අධ්‍යක්ෂ තනතුරු සඳහා අභ්‍යන්තර සම්මුඛ පරීක්ෂණ සඳහා අයදුම්පත් කැඳවා පවත්වන ලද අතර කනිෂ්ඨ කළමනාකරු තනතුරු සඳහා ද අයදුම්පත් කැඳවන ලදී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නැවත සම්මුඛ පරීක්‍ෂණ පැවැත්වීමට යෝජනා කර තිබුණ අතර නැවත සම්මුඛ පරීක්‍ෂණ මේ වන විට පැවැත්වීමට නියමිතය. | පුරප්පාඩු වූ තනතුරු කඩිනමින් පිරවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) 2010 පෙබරවාරි 09 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද කාර්යාංශයේ බඳවා ගැනීමේ පරිපාටිය අනුව මූලික සුදුසුකම් සපුරා නොමැති නිලධාරීන් කාර්යාංශයට | බඳවා ගැනීමේදී අනුමත බඳවා ගැනීමේ පරිපාටි වලට අනුකූලව සුදුසුකම් අදාළ සම්මුඛ පරීක්ෂණ මණ්ඩල විසින් සලකා බලනු ලැබේ. 2009 දී අනුමත කරන ලද බඳවා ගැනීමේ පරිපාටිය ප්‍රකාරව සලකා | සියලුම බඳවා ගැනීම් සහ උසස්වීම් අනුමත බඳවා ගැනීමේ පරිපාටි වලට අනුකූල විය |

| | | | |
|---|---|---|---|
| | බඳවාගෙන ඇති අවස්ථා ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය. | බලා ඇති සුදුසුකම්වලට අනුකූලව නිලධාරීන්ට සුදුසුකම් තිබේ නම් බඳවා ගැනීම් සිදු කර ඇත. කෙසේ වෙතත්, බඳවා ගැනීමේ පරිපාටියෙහි දක්වා ඇති සුදුසුකම්වලට ඍජුව නොගැලපෙන බඳවා ගැනීම් මැතදී සිදු කර නොමැත | යුතුය. |
| (ඇ) | ස්ථිර සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු නොතිබුණද රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතියක් හෝ ලබානොගෙන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියට යටත්ව ලබාදුන් අධ්‍යක්ෂ මණ්ඩල තීරණයකට අනුව 2019 ඔක්තෝම්බර් 10 වැනි දින කොන්ත්‍රාත් පදනමින් බඳවාගත් සේවකයින් 18 දෙනෙකුට ස්ථිර පත්වීම් ලබා දී තිබුණි. කෙසේ වෙතත්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන දැනුම් දෙන තුරු සේවයට වාර්තා නොකරන ලෙස එම සේවකයින්ට 2020 ජූලි 16 වන දින දැනුම් දී තිබුණි. එහිදී ඔවුන් විසින් කාර්යාංශයට එරෙහිව නඩුවක් පවරා තිබුණි. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව කොන්ත්‍රාත් පදනමේ සේවකයින් සඳහා ස්ථිර පදනමින් කළමනාකරණ සහකාරවරුන් බඳවා ගැනීමට අනුමැතිය ලබා දී නොතිබුණි. කම්කරු විනිශ්චය සභාව එම සේවකයන්ට වන්දි ගෙවා යළි සේවයේ පිහිටුවන ලෙස නියෝග කර තිබුණි. එබැවින් කම්කරු විනිශ්චය සභාවේ නියෝගයට එරෙහිව කාර්යාංශය විසින් මහාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කර තිබූ අතර පසුව ඔවුන්ට පක්ෂව නිකුත් කළ නියෝගයට එරෙහිව කම්කරු විනිශ්චය සභා නඩුවේ අයදුම්කරුවන් ද අභියාචනයක් ගොනු කර ඇති බව දන්වා තිබුණි . | සියලු බඳවාගැනීම් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශවලට අනුකූල විය යුතුය. |